සමුළුවේ අවසාන රාත්‍රියේ පැවතී සුහද හමුවේදී, තමන් සම්බන්ධ වූ සාර්ථක පරිසර ව්‍යාපෘතියක් විස්තර කිරීමට සිදුවිය. මා විස්තර කළේ 1994 වසරේදී, මා හටද සම්බන්ධ වීමට අවස්ථාවක් ලබුනු පරිසර අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක කළ, "පරිසර දුම්රිය" වැඩ සටහනයි. මෙම වැඩ සටහනෙහි දී, දුම්රිය ගමන සඳහා තෝරාගත් පාසැල් සිසු සිසුවියන් තුන් සියයක් පමණ රැගෙන කොළඹ සිට මහනුවර දක්වා ගිය දුම්රිය ගමනට එකතුවූ, විද්වතුන් කිහිප දෙනකු විසින්, මග තොටේ පරිසර අසිරිය, ශබ්ද විකාශන ක්‍රමවේද මගින් සියලූම සිසුනට පැහැදිලි කර දෙනු ලැබීම සුවිශේෂී අධ්‍යාපන ක්‍රමයක් විය.

අපගේ එම ව්‍යාපෘතිය සමුළුවට සහභාගී වූ කාගේත් පැසසුමට ලක් විය.


වන අරණ පුරා මොණරු


ශ්‍රී ජවහර්ලාල් නේරු පරිසර අධ්‍යාපන මධ්‍යස්ථානය







## Alpha Academy 2017

Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application, please text student name, Class and school to 0457908918**






# මියන්මාර් සරණාගතයින්ගේ සත්‍ය කතාව

**රංජිත් කීර්ති තෙන්නකෝන්**

මෑත ලංකා ඉතිහාසයේ කිසිදු විදේශිකයෙකුට ලංකාවේ ස්ථිර පුරවැසි බව ලැබී නැත. දෙන්නට නීතියක් ද නැත.

මහ මුහුද මැද බෝට්ටුවක අතරමං වී සිටි මියන්මාර් වැසියන් 30 දෙනෙකු ලංකාවේ නාවික හමුදාව විසින් බේරාගෙන ගොඩබිමට ගෙන එනු ලැබීය. ඔවුන් උතුරුකරයේ කාලයක් රැඳී සිට පසුව කොළඹට ගෙන එනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීමෙනි.

ලංකාවට බුරුමයෙන් මුලින්ම සරණාගතයින් පැමිණියේ 2012 වසරේ ය. ඒ පිරිස 100 කට වැඩිය. එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත්වී ඒ පිරිස ඇමරිකාවේ සහ කැනඩාවේ සරණාගත තත්වය ලබාදී ඔවුන් ලංකාවෙන් පිටත් වී ගොස් ජාත්‍යන්තර නීතිය හා පහසුකම් සහිතව නව ජීවිත අරඹා ඇත.

**ලංකාවේ මුග්ධයින් පිරිසක් ජීවිතය පරදුවට තබා මහ සයුරේ සටන් කර දිවි බේරාගන්නා මිනිසෙකුට හෝ අනුකම්පා නොකරන බංකොලොත් දේශපාලන නරුම රැළකගේ උසිගැන්වීමට අන්ධානුසාරයෙන් ගොදුරුව සිටිති.**

1948 අංක 20 දරණ "ආගමික හා විගාමික පනත" අනුව ලංකාවේ රජයට කිසිම පුද්ගලයෙකුට ස්ථිර පුරවැසිභාවය හෝ PR යැයි කියන තත්වය ලබාදීමට නීතිමය හැකියාවක් ලංකාවේ නැත. ඒ නිසා මියන්මාර් වැසියන්ට ලංකාවේ පුරවැසි භාවය ලැබීම හිතලූවක් පමණි. ලංකාව, ලෝකයේ ස්ථිර පුරවැසි භාවය ලබාදීමට නීතිමය ප්‍රතිපාදන නොමැති රාජ්‍යයන් කිහිපයකින් එකකි. ඒ නිසාම ලංකාවට ලෝකයේ කිසිදු සරණාගතයෙකු බාර ගැනීමට හැකියාව නැත. බාරගෙන ඇත්තේ ද නැත. එක්සත් ජාතීන්ගේ සංවිධානයට එවැන්නක් කිරීමට හෝ ඉල්ලා සිටීමට ද හැකියාවක් නැත. ඉල්ලා ද නැත. ආගමන විගමන පාලක වීරසේකර මහතා මේ බව සහතික කරයි. මෙම නීතිය කොරතම් බලවත් ද යන්නේ නම්, ලංකාවේ පුරවැසියෙකු විදේශිය කාන්තාවක් හා විවාහකර ගත්තේ වුව ද, ඇයට, ස්ථිර පුරවැසි බව ලැබෙන්නේ නැත. ඇයට හිමිවන්නේ ද, කාලාථයාගේ විසා බලපත්‍රය කි.

ලංකාවේ දැන් සිටින මියන්මාර් සරණාගතයින් පිරිස අතර පිරිමි 7 ක්, ගැහුණු 7 ක් හා ඉතිරි පිරිස දරුවන් වෙති. එකතුව 30 කි. එයට අමතරව ලංකාවේ දී එක් දරුවෙකු උපත ලබා ඇත. අඩුම ගානේ ඒ දරුවාට ලංකාවේ පුරවැසි බව ලබාදෙන්නට හෝ නීතියෙන් ඉඩක් නැත. මෙයට අමතරව ව්‍යාජ පාස්පෝට් භාවිත කරමින් පැමිණි 4 දෙනෙකු ද වෙනම මේ පිරිස සමග සිටී. එකතුව 35 කි.

ජාත්‍යන්තර නීතියට අනුව මේ පිරිස රැඳී සිටිනේනේ එක්සත් ජාතීන්ගේ රැකවරණයි යටතේ ය. ඔවුනට කන්නට බොන්නට අඳින්නට දෙන්නේ ද, පුංචි දරුවන්ට සෙල්ලං බඩු, පෑන් පැන්සල් දෙන්නේ ද, ලංකා රජය නොව එක්සත් ජාතීන්ගේ සංවිධානය යි. ඔවුන්ට රැකවරණය දීමට බටහිර රාජ්‍යයන් කිහිපයක් සමග එක්සත් ජාතීන්ගේ සාකච්ඡා සිදුවේ. අද දිනය පුරාම කොළඹ එක්සත් ජාතීන්ගේ පමණක් නොව බටහිර තානාපති කාර්යාල සිදුවන දේ ගැන වාර්තා කරමින් සිටිනවාට සැක නැත. බොහෝ විට මේ 35 දෙනාට ද, මෙයට පෙර 2012 දී සිදු වූ ලෙසම, ඇමරිකාව හා කැනඩාව සරණාගත පහසුකම් සැපයීමට ඉඩ ඇත. එය එසේම වේවා ඉක්මනින් වේවා

මා මේ සටහන තබන්නේ වෙනත් හේතු නිසාය. පළමුවැන්න, අප බෝට්ටුවෙන් එන අසරණයින්ටත් බිය ජාතියකි. දෙවැන්න, ලංකාවේ මුග්ධයින් පිරිසක් ජීවිතය පරදුවට තබා මහ සයුරේ සටන් කර දිවි බේරාගන්නා මිනිසෙකුට හෝ අනුකම්පා නොකරන බංකොලොත් දේශපාලන නරුම රැළකගේ උසිගැන්වීමට අන්ධානුසාරයෙන් ගොදුරුව සිටී. තෙවනුව, අපට රටේ නීතිය හා ව්‍යවහාරය පිළිබඳ අවබෝධය අල්පය. සරණාගත මංකොල්ලකරුවෙකු වූ විජය ලංකාවට ගොඩ බසින විට 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත තිබුණේ නැත. අවසානාවකි. මිහිදු හිමියන් එන විට තිබුණේ ද නැත. බෙදවාචකයකි

1983 න් පසුව ලාංකිකයින් ලක්ෂ 18 කට වැඩි පිරිසකට බටහිර රාජ්‍ය සරණාගත තත්වයන් ලබාදී රැක බලාගෙන ඇත. ඇත්තටම එක්කෝ බටහිරට පිස්සු ය. නැතිනම් අපිට පිස්සු ය.

සිදුවීම් විසින් සමාජය නිරුවත් කරන්නේ ය.